# ශ්‍රී ලංකාවේ සියදිවිනසා ගැනීම සඳහා බලපාන සාධක

**පී. එස්. මධුභාෂිණී**[1]

**සංක්ෂේපය**

ඉංග්‍රීසි බසින් " Suicide " යන පදයට පර්යාස වශයෙන් සිංහල භාෂාවෙහි සියදිවි නසා ගැනීම ආත්ම ඝාතනය, ආත්ම ගුණය යනාදි වශයෙන් ව්‍යවහාරයත් රාශියක්ම සමාජ ගතව පවතී. වර්තමානය වන විට දල වශයෙන් ලෝකයේ මිනිසුන් ලක්ෂ 8 - 10 ත් අතර සංඛ්‍යාවක් සියදිවි නසා ගැනීම නිසා ජීවිතය නැතිකර ගන්නා අතර එය 100,000 ට 11.4 ක් වේ. ශ්‍රී ලංකාවේ වාර්තා වන ප්‍රමාණය 2012 වර්ෂය වන විට 100,000 ට 28.8 පමණ වේ. මෙසේ සිය දිවි නසා ගැනීමේ ලෝක තත්ත්වය අනුව, ශ්‍රී ලංකාව සිව්වන ස්ථානයෙන් වාර්තා වේ. නමුත් ලංකාව තුල සියදිවි නසා ගන්නා සංඛ්‍යාව වසරින් වසරට අඩුවෙමින් පවතී. එනම්, 1995 වසරේදී 8500 ක් පමණ සියදිවි නසාගෙන තිබූ අතර එය 2014 වන විට 3140 දක්වාද පහළ බැස ඇත. මෙරට අඛණ්ඩව සැලකිය යුතු කාලයක් වැඩිම සියදිවි නසා ගැනීම් සංඛ්‍යාවක් වාර්තා වූ කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරින් සියදිවිනසා ගැනීම සඳහා බලපාන සාධක හඳුනා ගැනීම අධ්‍යයනයේ ප්‍රධානතම අරමුණ විය. අධ්‍යයනය සඳහා ප්‍රධාන වශයෙන්ම භාවිත ක්‍රමවේදය වූයේ, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රමයයි. 2014 වසරේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සියදිවිනසා ගත් පුද්ගලයින් 362 දෙනාගේ පවුල් අතරින් අහඹු ලෙස තෝරා ගත් පවුල් 20 ක් අධ්‍යයනයේ නියැදිය විය. මෙම පවුල් 20 ඇසුරින් සිද්ධි අධ්‍යයනය කරන ලදී. ව්‍යුහාත්මක හා ව්‍යුහාත්මක නොවන සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. අධ්‍යයනයේ ප්‍රධාන නිගමනයන් ලෙස, ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට සාපේක්ෂව පුරුෂයින් අතර සියදිවි නසා ගැනීමේ අනුපාතය ඉහළ බවත්, සියදිවිනසා ගැනීමට බලපානු ලබන ප්‍රධානතම සාධකය බවට පවුල් ආරවුල් බවට පත්ව තිබීමත්, සියදිවිනසා ගැනීමට භාවිතා කරන උපක්‍රමයක් ලෙස බහුල වශයෙන්ම වස පානය කිරීමත් දැක්විය හැකිය.

**මුඛ්‍ය පද :** සියදිවිනසා ගැනීම, වස පානය, පවුල් ආරවුල්

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, madhupalliyaguru@gmail.com